# නෙත්කිණී

(කෙටි කතාවකි)



හංසිකා රණවීර

# නෙත්කිණී

## (කෙටි කතාවකි)

හංසිකා රණවීර

කතෘ

(පළමු දිගහැරිම)

ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල

මහනුවර

ISBN - 9786242088600

2025.02.08

# පිදුම

මා ගේ දෙමාපියන්ටත්

සෙනෙවිරත්න මහලේකම් මහතාටත්

මෙම පොත

ආදරයෙන් පුදමි.

# පෙරවදන

ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව තුළ සංවර්ධනය සහ වෙනස්වීම්වලට ගැළපෙන දැනුම අවබෝධය සහ සරල බුද්ධිමය හැකියාවන්ගේ සිට විමර්නශීලි චින්තනය නිර්මාණාත්මක කුසලතා වලින් සමෝධානික වු ඉහළ බුද්ධිමය හැකියාවන් මෘදු කුසලතා පෙරදැරි වු භාවමය බුද්ධිමය හැකියාවන්ගෙන් පරිපූර්ණ වු සමබර පෞරුෂයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීමේ වගකීම අද වන විට ගුරුවරයා වෙත පැවරී තිබේ ඒ සඳහා සමබර පෞරුෂයකින් හෙබි ගුරුවරයෙකු පාසලට අවශ්‍යය වෙයි ඔහු තුළ මෘදු ජීවන කුසලතා වැඩි දියුණුව පාසල් පාදක ගුරු සංවර්ධන ව්‍යාපෘති හරාහා සිදුකිරීම වඩත් ඵලදායි වෙයි
දැනට වසර ගණනාවක සිට අප පාසල් දියණියන් සහ ගුරුභවතුන් එක්ව ග්‍රන්ථ රචනා කරමින් රටේ පාසල් පද්ධතිය තුළ සාහිත්‍ය ප්‍රබෝධයක් මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමට මුල් වීම පාසලක් වශයෙන් අප ලබන ජයග්‍රහණයකි.

මෙවර අප පාසලේ ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණ ගත්කරණී "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට ආදර්ශයක් දෙමින් තම සාහිත්‍ය නිර්මාණාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙවන් කෘතියක් රචනා කරන්නට ඉදිරිපත් විම ප්‍රශංෂනීය කරුණකි ගත්කතුවරයෙකු වීම තම ගුරු දිවියට නව අගය එකතු කිරීමක් බව මගේ හැඟීමයි.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

# පෙරවදන

මම ඉමහත් ප්‍රීතියෙන් ලියන මගේ මෙම පෙරවදන ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසලේ තරුණ ලේඛකයින්ගේ නිර්මාණශීලීත්වය, වෙහෙස මහන්සි වී වැඩ කිරීම සහ කැපවීම ඉස්මතු කරයි. අපගේම තරුණ කතුවරුන්ගේ ලේඛන සහිත පොතක් ප්‍රකාශයට පත් කිරීමේ අපගේ  උත්සාහය මෙය වන අතර, ග්‍රීන්හිල් හි සියලු දෙනාට ලබා දී ඇති කාර්යයේ ජයග්‍රහණ පිළිබඳව මා කෙතරම් ආඩම්බර වනවාද යන්න ප්‍රකාශ කිරීමට මට අවසර දෙන අතර ව්‍යාපෘතියට සහාය වූ ගුරුවරුන්ට, දෙමාපියන්ට සහ උපදේශකයින්ට මගේ කෘතඥතාව පළ කරයි. හෙට දවසේ සහ ජාතියේ මෙම අංකුර නායකයින්ගේ අනාගතය හැඩගැස්වීමේදී කතන්දර කීමේ, ස්වයං ප්‍රකාශනයේ සහ වචනවල බලයේ වැදගත්කම ද අවධාරණය කරමි.

අවසාන වශයෙන්, සිසුන්ව දිරිමත් කරන අතරම ඔවුන්ගේ අදහස් දිගටම ලිවීමට සහ බෙදා ගැනීමට ඔවුන්ව පොළඹවනු ලබයි.

අපගේ සිහිනය සැබෑ කර ගැනීම සඳහා ලබාදුන් මගපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් අපගේ පුස්තකාලයාධිපති හංසිකා රණවීර මහත්මියට සහ ප්‍රවීන ලේඛක සහ ලේඛක සෙනෙවිරත්න මහාලේකම් මහතාට විශේෂ ස්තුතිය පුදකර සිටිමු.

"යුතුකම පළමු සතුට ඊළඟට"

ආචාර්ය ලලිත් නවරත්න
විදුහල්පති
ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල
මහනුවර

හිමිදිරි උදෑසන ඉතා ම නිහඬ ය. කුරුල්ලන්ගේ කිචිබිචි නාදයත් ද දොළ පහරේ සද්දයත් ඇරෙන්න වෙනත් ඝෝෂාකාරි හඬවල් නොඇසේ. මා ප්‍රිය කරන්නේ ඒ නිහඬ බවට ය.

මා උදෑසන ම දොළ අසලට පැමිණියේ ඉක්මනින් ම රෙදි සෝදා ගෙන නිවසට යාමට ය. නමුත් මෙම නිහඬ පරිසරයත් සමග ම මට මාගේ අතීතය මතක් විය.

මගේ නම නෙත්කිණි දිල්හාරා හේරත් ය. මගේ අම්මා තමයි මගේ නම දලා තිබුණේ. ඒ මගේ ඇස් දෙක ලස්සන නිසා කියලා අම්මා දවසක් කියුවා මට මතකයි. ඒක ඇත්ත වෙන්න ඇති ගමේ කට්ටියත් පාසල් යහළුවෝත් මට නිතරම ඇස් දෙක ලස්සනයි කියලා කියනවා. අපි ජීවත් වෙන්නේ මාතලේ කිරිඔරුව ගමේ ය. අපේ ගම හරි ම ලස්සනයි සහ පිරිසිදුයි. අපිට තිබුනේ පුංචි ම පුංචි මැටි ගහපු ගෙදරක් ය. අම්මා පිළිවෙලට අපේ ගෙදර තියාගෙන හිටියා ය. ඒ වාගේ ම අපිටත් පුංචි කාලයේ ඉදන් ම පිළිවෙලට ඉන්න කියලා දුන්නා. මට නංගි කෙනෙකුයි මල්ලි කෙනෙකුයි ඉන්නවා. මල්ලි නම් දග මල්ලෙක්. ඒ අපේ ගෙදර බාලයා නිසාත් වෙන්න ඇති. අපේ අප්පච්චි කරේ කුලි වැඩ ය. අම්මාට හොදට මහන්න පුළුවන් . ඒ නිසා අම්මා ගමේ අයගේ ඇදුම් මැහුවා. අගහිගකම් කොපමණ අගහිඟකම් ගොඩාක් තිබුනත් අපි සතුටින් ජීවත් වුනා . අප්පච්චි හවසට ගෙදර එද්දි අපි බලන් ඉන්නෙ අප්පච් ගේන කඩචෝරු මල්ල කන්න යි. අප්පච්චී පොඩි දෙයක් ගෙනාවා උනත් අපිට ඒක ලොකු දෙයක් වුනා. අපි නිතරම හවසට පැදුරු සාජ්ජ දානවා, සින්දු කියනවා, සෙනසුරාදාට අනිවාර්යෙන් පන්සල් යනවා පන්සලේ බෝධි පූජාවට සහභාගී විමට. අපි ගොඩක් සතුටින් හිටපු පවුලක්.

ඒත් එකම එක මූසල දවසක අපේ ජීවිත වෙනස් වුනා. ඒ අපේ අම්මා අසනීප වී රෝහල් ගත කරන්න උන දවස යි.

" අම්මාට පිළිකාවක් අවසන් අදියරයේ ඉන්නේ" කියලා දොස්තර මහත්තයා කියුවා.අපේ ජීවිත නැති උනා වාගේ.

"අනේ දොස්තර මහත්තයෝ මගේ පණ බේරලා දෙන්න"අප්පච්චි දොස්තර මහත්තයාගේ කකුල් දෙක අල්ලලා වැන්දා. දොස්තර මහත්තයලා ගොඩාක් උත්සාහ කරත් අපිට අම්මව බේරගන්න බැරි වුනා. අම්මා නැති උනා කියනවා විතරයි මට මතක මගේ සිහිය නැති උනා.එතකොට මම හිටියේ දහය වසරේ. ගෙදරම සොහොනක් වගේ මට දැනුනේ එහෙම.

අම්මා අන්තිමට කියපු දේ මගේ හිතට කිදා බැහැලයි තිබුණේ.

"මගේ මැණික හොඳට ඉගෙනගෙන හොඳ තැනකට ඇවිල්ලා අප්පච්චියි නංගිවයි මල්ලිවයි බලාගන්න පුතේ"

අම්මා ඉස්පිරිතාලේ ඉන්න දවසක ඒ අම්මා මට කතා කරපු අන්තිම වචන ටික."මං පොරොන්දු වෙනවා අම්මේ අනේ අම්මේ අපිව දාල යන්න එපා" කොච්චර කෑගහලා ඇඩුවත් වැඩක් උනේ නැහැ.

ඊට පස්සේ අපේ හැමෝගෙම ජීවිත වෙනස් වුණා. අප්පච්චි බීමට ඇබ්බැහි වුනා. බීලා ඇවිත් කෑගහලා නිදගන්න්වා. දවසට එක වේලක් තමයි කන්න පුළුවන් වුනේ.අපට ඉස්කෝලේ යන්නත් ආර්ථික අපහසුතා මැද අමාරු වුනා. අපිට ඉස්කෝලේ යන්න ඉස්කෝලේ විදුහල්පති ගුරුවරුන් කීපදෙනෙකු ද පන්සලේ ලොකු හාමුදුරුවෝ උදව් කරා.මම දැන් සාමාන්‍ය පෙළ ලියලා ප්‍රතිඵල එනකල් ගෙදර ඉන්නෙ.

මං අතීතයේන් මිදුනෙමි. මං උදෑසනම රෙදි සේදීමට පැමිණියේ එහා ගෙදර සුමන අක්කා යන ගාමන්ට් එකේ ඇබැර්තු ඇති බවට සුමනා අක්කා පැවසූ නිසා ය. මා ඉක්මනින් නිවසට ගොස් සුදානම් වි සුමනා අක්කලාගේ ගෙදර ගියෙමි.

" සුමන අක්කේ. " කියා මා සුමන අක්කාට අඩ ගැසුවෙමි.

"ටිකක් ඉන්න නංගීයේ" සුමන අක්කා ගෙදර සිට කෑගසුවාය.

යමු නංගි මම සුපවයිසර් නෝනාට කිව්වා. නංගිට මහන්න පුළුවන් නිසා නංගිට රස්සාව හම්බවෙයි." යැයි සුමනා අක්කා කිවුවා ය.

"ගොඩාක් පින් සුමනා අක්කා මේ වේලාවවේ ලොකු දෙයක් රස්සාවක් හොයාගන්න එක මට." යැයි මම පැවසුවෙමි.

මම ඉන්පසු ගාමන්ට් එකේ වැඩට ගියෙමි. ඒ නිසා අපගේ නිවසේ සියලු දෙනාටම තුන්වේල කන්න පුළුවන් වුණා. නංගිගේ මල්ලිගේ පාසල් අවශ්‍යතා ද මට ඉටු කිරීමට හැකි වුන නිසා එය මගේ සිතට සැනසිල්ලක් වුනා.

"නෙත්කිනි.. නෙත්කිනි….."

මා නිවසෙන් පිටතට පැමිණි රැකියාවට යාමට යාමට සූදානම් වී කවුරුන්ද මේ උදෑසනම කෑ ගසන්නේ කියා දැනගැනීමටය. ඒ මාගේ පාසල් මිතුරියක් වන සුබානි ය.ඇයව මේ වේලාවේ දැක මා පුදුමයට පත් වුනි.

"මොකද සුබානි මේ උදේ පාන්දර "දැයි මා අසා ඇය අසලට ඉක්මනින් ගියා.

"රිසාට් ඇවිත් බන්" ඇය පැවසූහ.

" අනේ.. රිසාට් බැලුවද බන්" මම ඇයගෙන් ඇසුවෙමි.

"ඔව් මං පාස් අයියගේ ෆෝන් එකෙන් තමයි බැලුවේ. මම අයියගේ ෆෝන් එක අරන් ආවා උබේ රිසාට් එකත් බලමු." සුබානි කියුවාය.

සිත දෙගිඩියාවෙන් දෝලනය වුන ද මම මාගේ ප්‍රවේශපත්‍ර අංකය ඇයට දුන්නේමි.

"හුරේ….. උබට A 9 ක් " යැයි ඇය පැවසූහ.

මට අදහා ගන්නට නොහැකි විය .මට මගේ අම්මා අද සිටි නම් ඇය ගොඩාක් සතුටු වෙයි. අප්පච්චිට කියූ විට අප්පච්චිගේ දෑස් වල සතුටු කඳුලු මම දුටුවෙමි.

නමුත් මම උසස් පෙළ හදාරන්නේ නැති බවට තීරණය කරගෙන සිටියෙමි. මාගේ ගෙදර ප්‍රශ්න නිසා ය.නමුත් විදුහල්පති තුමාගේ මැදිහත්වීමෙන් මා හට ශිෂ්‍යත්වයක්ද ලැබුණි. එම නිස මට ටවුමේ ඉස්කෝලෙට යාමට හැකි විය. අප්පච්චි දැන් වැඩිය බීමට අත්බැහි වී නැත.නැවතත් අප ගැන ගැන සොයා බලයි. මගේ සිතට එය මතත් අස්වැසිල්ලකි.

..........................................................................................

සිරිමාවෝ බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලයේ විද්‍යා අංශයෙන් උසස්වල හැදෑරීමට ඇතුළත් විය.අද මාගේ පළමු දිනයයි.

"අලුතින් ආපු ළමයි කවුද? කෝ බලන්න නැගිටිනවා නැගිටිනවා කියා පන්තියේ සිටි පිරිමි ළමයෙක් කියුවේ ය.ළමයි හය හත් දෙනෙක් එවිට නැගිට සිටි අතර මා ද නැගී සිටියහ.ඉන්පසුව ඔවුන් අපිට රැග් කිරීමට පටන් ගත්හ.

"මොකක්ද නම"පිරිමි ළමයෙකු මාගෙන් විමසුවේය.

"නෙත්කිණි" හීන් හඬින් මම පිළිතුරු දුන්නෙමි.එය ඔහුට ඇසුණේ ද යන්න පිළිබදව සැකයක් මා තුළ ඇති විය.

"ඇස් දෙක නම් ලස්සනයි නමත් ගැලපෙනවා" පිරිමි ළමයා පැවසුවේ ය.

මම බිම බලා බලා ගත්තෙමි. ළමුන් සියලු දෙනාම බාල සිටි නිසා මා අපහසුතාවයට පත් වුණු දැයි මට සිතුණි.

"හරි මැඩම් දැන් බක වරක් චක්කරේ කියලා පෙන්වන්න" පිරිමි ළමයෙකු කෑගසුවෙමි.

මා ගැස්සී ගොස් ඔහු දෙස බැලුවෙමි.

"කෝ කියමු කියමු" තවත් ගැහණු ළමයෙක් කෑගසුවා ය.

" බක වරක් 1 - බක

" බක වරක් 2 - බක, බක

" බක වරක් 3 - බක, බක, බක"

මා බිමට නැඹුරු කරගත් මුහුණින් යුතුව මුමුණන්නට විය.

"කෝ තව හයියෙන්" පිරිමි ළමයෙකු කෑගැසුවේ ය. ළමුන් සියල්ල ම සිනා සුනාය. මගේ දෑසට කඳුලු ඉනුණි.

"ඇති බං දැන් නවත්තපන් දැන් සර් ඒයි. වාඩිවෙන්න හැමෝම " කියා පිරිමි ළමයෙකු කියුවේ ය. මා ඔහු දෙස බැලුවෙමි. ඒ මාගේ නම ඇසූ පිරිමි ළමයා ය.

"මගේ නම අහස් උසස් පෙළ විද්‍යා අංශයට ඔබා සාදරයෙන් පිළිගන්නවා. ඔහු කියුවේ ය.මා ද මද සිනහවක් ඔහුට පෑවේ ය.

ඉන් පසු පංතියේ වැඩ කටයුතු අරම්භ කෙරුණි. දින කිහිපයක් ම ගෙවි ගියෙමි.ඒක් දිනක් පංතියේ ළමුන් ඒක්ව අහාර ගනිමින් සිටියේ ය.

"නෙත් වරෙන් බං කන්න."නමුත් මගේ බත්පතේහි ඇත්තේ පොල් සම්බෝලයක් පමණි.ඒම නිසා මා ඔවුන් සමග ඒක් විමට මැලිකමක් දැක්වුවෙමි.

"ඔයාලා කන්න අහස්" මම කියුවෙමි.

නමුත් ඔවුන් මා ද බලෙන් ම ඔවුන් සමග අහාර ගැනිමට ඒක් කර ගන්නේ ය.

"ඉක්මන්ට ගන්නකෝ නෙක්කිණි ඔයාගේ බත් ඒක" ගැහැණු ළමයෙකු කෑගැසුවාය.

මා හිමිට මගේ බත් එක දිගාරින්න්ට වුණි.

"අපෝ සම්බෝල විතරද" තවත් ගැණු ළමයෙකු කෑගසුවාය .

"ෂා පොල්සම්බෝල කියන්නේ ආගමක්නෙ" අහස් පැවසියමගේ බත් එක අහස් හා අනෙකුත් පිරිමි ළමයි කැවෝය.

"අම්මාට කියන්න නෙත් බත් එක රසම රසයි කියලා". අහස් කියුවේය.

මගේ දෑසට කඳුළු ඉනුණි.මට මාගේ මව සිහි විය.

"මගේ අම්මා නෑ" යයි මා හිමින්ට කියුවේමි.

සියලු දෙනාම මා දෙස බලා සිටින විට මා හට අපහාසතාවයක් දැනුනේ ය.ඒ නිසා පන්තියෙන් මම ඉවතට ගියහ. මට ඇඬුණි. එවිට අහස් ද පැමිණ ඇති බව මා දන්නේ ඔහු මට කතා කරන විට ය.

"සොරි මචන් අපි දැනං හිටියේ නැහැ" . ඔහු ශෝකයෙන් කියුවේය.

"ඒකට කමක් නෑ"මම පැවසුවේමි.

"හැබැයි කෑම එක නම් පට්ට"ඔහු පැවසුව විට මට සිනහ ගියහ.

"ඔන්න ඔහොම හිනා වෙලා හිටපන් බං ඔය ඇස් දෙකට කඳුළු ලස්සන නෑ. යමං පන්තියටද දැන් ඔහු පැවසූ පසු අප දෙදෙනාම පන්තියට ගියෝය.

ඉන් පසු අහස් සහ ඔහුගේ යහළුවන් මගේ හොඳම යහළුවන් බවට පත් විය.ඉස්කෝලේ වැඩ, පාඩම් කරේ, කෑම කෑවේ, පාසලේ බාහිර ක්‍රියාකාරකම් හැම දෙයක්ම කරේ අපි එකටය.

මම හවසට ළමුන් කීප දෙනෙකුට ටියුෂන් කරාය.මගේ කලින් පාසැරේ ගුරුවරයෙක් එම අවස්ථාව මට සලසා දුන්හ. අප්පච්චි දැන් අපි ගැන ගැන අවධානය ලබා දෙනවා දෙනවා. වෙනදාට වඩා අපි ගැන බලනවා

දවසක් මගේ බෑග් එකේ අලුත් පොත්, පෑන්, පැන්සල්, වගේ මොනවා හරි දාල තියෙනවා. මං දන්න නෑ ඒවා කාගෙද කව්ද මගේ බෑග් එකට ඒවා දාන්නේ කියලා. දින ගණනාවකම සිට ම මං බලා සිටියේ ඒ කවුද කවුද කියා දැනගැනීමේ ආශාවකින් මං පසු වුනෙමි.

එක් දිනක මම දකිනවා අහස් මගේ මගේ බෑගයට පොත් දනවා.

"ඇයි අහස් මට මෙහෙම උදව් කරන්නේ" යැයි මා ඔහු අසලට ගොස් ඇසුවෙමි .

"පිස්සුද මචන් මං මොනවත් කරේ නෑ "යැයි ඔහු පැවසිය.

"මං දැක්කා මගේ බෑග් බෑග් එකට ඔයා පොත් දානවා" කියා මම කියූ විට ඔහු හිස බිමට නැඹුරු කර සිටියේය .

"මගේ යාලුවෙක් ඉන්නවා මචන් ඔයාලගේ ගමේ මට හැම විස්තරයක්ම කියුවා. අනුකම්පා කරලා නෙමේයි මං උදවු කරේ.කවද හරි ඩොක්ටර් කෙනෙක් වෙන්න කියන විශ්වාසයෙන් තමයි මම උදවු කැරේ.

මම පුදුමයට පත් වී ඔහු දෙස බැලුවෙමි.අහස් පොහොසොන් පවුලක ළමයෙක් බව මා දැන සිටි.නමුත් අනෙකුත් අයට වැඩිය ඔහු වෙනස් බව මට හැගුණි.

කෙමෙන් කෙමෙන් අවුරුද්දක් ම අවසන් විය. කාලය වන විට අහස් මටත් මගේ නංගීටත් මල්ලිටත් උදව් කරන ලදි. මගේ සිතේ අහස් පිළිබඳව පැහැදීමක් ඇතිවන්නේ මෙම දවස්වල ය.

"මචං ක්ලාස් වරෙන් මම සර්ට කියලා ෆී කාඩ් එකක් ගත්තා.ඉස්කොලේ ගිහින්ම් බෑ බං" අහස් පැවසූවේ ය.

"අනේ ඇත්තමද" මම ඇසුවෙමි.

"ඔව් බං මේ සෙනසුරාදා පංතියට එන්න" ඔහු කියුවේය.

"පිං බං " මා පැවසූහ.

අහස් සිනහා සුණා පමණි .

මටඋසස් පෙළට පන්ති යාමට නොහැකි වුනේ මාගේ ආර්ථික තත්ත්වය නිසා ය.ඉන්පසු මගේ හැමදෙකටම අහස් සිටියය.

එක් දිනක් පන්ති ඇරී එනකොට පිරිමි ළමයෙකු මා පසු පස පැමිණියේ ය. නිතරම මා පසුපස එයි මට කරදර කරයි.

"ඇයි අඩන්නේ බං" අහස් ඇසුවේය.

මම අහසට හැමදෙම කියුවෙමි.

"ඇයි මට කලින් කිව්වේ කිව්වේ නැත්තෙ"අහස් අසන විට මම බිම බලාගෙන සිටියෙමි.

ඉන් පසුව ඒ මා පසුපස ආ පිරිමි ළමයා මා දුටුවේ නැත.අහස් ඔහුට මොනවා කරාදැයි මාත් තවමත් දන්නේ නැත.

දිනෙන් දිනෙන් දින කාලය ගෙවුණි. උසස් පෙළ විභාගයට ඉතිරිව ඇත්තේ තවත් මාස කිහිපයකි. මා හොදින් පාඩම් කළාය. උසස් පෙළ විභාගයට දින ලං වී තිබුණ නිසා මාත් නංගීත් මල්ලි අප්පච්චි කැටුව පන්සලට ගොස් අම්මාවත් සිහිකර බෝධි පූජාවක් තිබුණි.

කෙමෙන් කෙමෙන් උසස් පෙළ විභාගය අවසන් වුණි.නැවතත් පාසල් යාමට නොහැකි වු නිසා සිතට දුකක් දැනුණි.

අහස් කොතරම් ඉල්ලා සිටියත් මා පරිගණක පාඨමාලාවක් හැදෑරිමට නොගායේමි. මා නැවතත් කලින් සේවය කර ගාමන්ට් එකෙහි වැඩට ගියේමි.

උසස් පෙළ ප්‍රතිඵල පිට වු බව දැනගත් විගසම මම ටවුන් එකට ගියේමි. අපේ පාසලේ ඇතැම් මිතුරෝ ද සිටි අතර අහස් ද ඒ අතර විය.

"මචං රිසාස් බැලුවේ නැද්ද" අහස් විමසුවේ ය.

"තාම නෑ. ඔයා බැලුවද අහස්" මම විමසුවෙමි.

"මම පාස් A ඒකයි B එකයි C එකයි " ඔහු කියුවේය.

"සුභ පැතුම් අහස්" මම කියුවෙමි.

"වරෙන් රිසාට් බලමු." අහස් පැවසුවේය

තැතිගත් සිතින් යුතු ව මා ප්‍රවේශපත්‍ර අංකය ලබාදුණි.

"හුරේ......මචං A3ක් දිස්ත්‍රික් රැන්ක් එක එක බං"යැයි කියා ඔහු උඩ පැන්නේය.

මට සතුටට ඇඩුනි. මගේ යහළුවන් පාසලේ ගුරුවරුන් ගමේ අය මට මට සුභ පැතුවෝ ය. ටීවි චැනල් සහ පත්තරලද මාගේ විස්තර පළ වුණි.

......................................................................................

මට පේරාදෙණිය විශ්ව විද්‍යාලයට යාමට හැකි විය. මා ද ආසා කරේ පේරාදෙණිය විශ්ව විශ්ව විද්‍යාලයට යාම ය.

මම නේවාසිකාගාරයෙහි නැවතී සිට ඉගෙන ගත්තේමි. අහස් කොළඹ ගියේය. පුද්ගලික විශ්ව විද්‍යාලයක ඔහු උපාධිය හදාරමින් සිටියේ ය.

ඔහු ඔහුට හැකි පමණින් මාගේ වියදම් වලටද මුදල් එවුහ. මම කොතරම් එපා කිව්වද ඔහු එය නැවැත්වූයේ නැත.

කාලය සීග්‍රයෙන් ගෙවී ගියහ. අවසානයෙහි මට වෛද්‍යවරියක් වීමට හැකි විය. මම අප්පච්චිත් නංගිත් මල්ලිත් හොදින් හොදින් බලා ගත්තේමි.හැකි පමණින් නිවසක් ද සැදුහ.

නමුත් මාගේ ජීවිතයේ යම් අඩුවක් තිබේ. ඒ මා වෛද්‍යවරියක් වූ දිනයේ පටන් අහස්ගෙන් කිසිම පිළිතුරක් ලියුමක් හෝ දුරකථන ඇමතුමක් අද වන තුරු ලැබී නැත.මා කොතරම් ඔහු ගැන සොයා බැලුවද ඔහුව සොයා ගත නොහැකි විය.යහළුවන් හා ඔහුගේ පවුලේ අය පැවසුවේ අහස් වැඩිදුර අධ්‍යාපනය සඳහා විදේශ ගත වි ඇති බව ය.

මා වෛද්‍යවරියක් වී අදට වසර තුනකි. මගේ ජීවිතේ මට ලැබුණේ නැති හැම දෙයක්ම දැන් ලැබී ඇත. මම තවමත් අහස් එනකුරු බලා සිටි. ඔහු කොතනද මොනවා කරනවද යන්න මා නොදනි.මගේ ජීවිතය සාර්ථක කරගන්න උදව් කරපු ඔහුට මගේ ජිවිතේ හැම මෙහොතෙම හිටපු ඔහුට ස්තුති කරන්නැයි මට වුවමනා වන්නේ.

ඔහු මාව සොයාගෙන පැමිණේ යයි විශ්වාසයෙන් මා අහස් එනකම් බලා සිටිමි.

මේ මාගේ කතාවයි.

අහස් වෙනුවෙන් ලියු කතාවයි.

නිමි.

# පසුවදන

රටක අනාගතය සඳහා මානව සම්පත සුදානම් කිරීමේ වගකීම පැවරී ඇත්තේ ගුරුවරයාටය එහෙයින් ඔහු කායික මානසික සහ සමාජීය වශයෙන් යහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වීම වැදගත්ය ඔවුන් සමාජයේ පෙරගමන් කරුවන් නිසා ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ දැනුමෙන් යාවත් කාලීන වීම ද දරුවන්ගේ පරමාදර්ශී චරිතයක් වීම ද අත්‍යවශ්‍ය වෙයි තමා වෙත පැවරෙන දරුවන්ගේ විභවතා හඳුනා ගනිමින් ඒවා ඔපවත් කිරීම ඔහුගේ සමාජ වගකීමයි

මෙම යථාර්ථ පසක් කොටගත් ගුරුවරයෙකු වශයෙන් මා පාසල් පද්ධතියේ සාහිත්‍ය නිර්මාණකරණය සහජ කුසලතාවය කොට ගත් දරුවන් දහස් ගණනක් දේශීය සාහිත්‍ය කෙතේ අනාගත ගත්කතු අංකුර ලෙසින් රෝපණය කරන්නක් විය ඊට සමගාමීව විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ වෘත්තිකයන්ට තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට ද වේදිකාවක් සකසාදීම ට ලැබීම භාග්‍යයකි මෙවර දෙස් විදෙස් පාසල් දරුවන් හා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා සමග පොත් ලියන "හෙරණගත්කරණී "ව්‍යාපෘතිය යටතේ රචනා වන මෙම කෘතිය පාසල් පද්ධතියේ දරුවන්ට මෙන්ම ගුරුවරුනට ද ආදර්ශයකි ඔබගේ නිර්මාණ දිවිය සඵල වන්නට සුභ පැතුම්

හෙරණගත්කරණී නිර්මාතෘ
සෙනෙවිරත්න මහලේකම්
2025 02 08